# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1906/8 - 2015 මාර්තු මස 17 වැනි අඟහරුවාදා - 2015.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(XI).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 91 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2015 මාර්තු මස 11 වැනි දින.

නියමාවලිය

1. මේ නියමාවලිය 2015 අංක 1 දරන විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල නියමාවලිය ලෙස හඳුන්වනු ලබන අතර එය 2015.03.11 දින සිට බලාත්මක විය යුතු ය.

2. මේ නියමාවලියේ විධිවිධාන (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) පනතේ 90 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අදාළ වන්නේ ය.

**I වන කොටස**

*අරමුදලේ දායකත්වය*

3. (1) මේ නියමාවලියේ විධිවිධාන, පනතේ 92 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අරමුදලට දායකවී ඇති හෝ ඉදිරියට දායක වන, කොමිෂන් සභාවේ හෝ යම් උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සඳහා අදාළ වන්නේ ය.

(2) අරමුදලේ සෑම දායකයකු විසින් ම පනතේ 92(1) වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට සහ ප්‍රමාණයට අරමුදලට දායක මුදල් ගෙවිය යුතු අතර, කොමිෂන් සභාව හෝ එම සාමාජිකයා සේවයේ නියුක්ත වී සිටින උසස් අධ්‍යාපන ආයතනය විසින් එහි විධිවිධාන සලස්වා ඇති මුදල් ප්‍රමාණය ගෙවීමෙන් අරමුදලට දායකත්වය ලබා දිය යුතු ය.

(3) එක් එක් මාසය සඳහා යම් දායකයකුගේ දායක මුදල කොමිෂන් සභාව විසින් හෝ එම දායකයා සේවයේ නියුක්තව සිටින උසස් අධ්‍යාපන ආයතනය විසින් එම දායකයාගේ වැටුපෙන් අඩු කරනු ලැබිය යුතු අතර, එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී අරමුදලේ ඇති එම දායකයාගේ වෙනම ගිණුමට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

### *අරමුදල පරිපාලනය කිරීම*

4. (1) (මෙහි මින්මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ ලේකම්වරයා අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ කළමනාකරණය භාරව කටයුතු කළ යුතු ය.

(2) ලේකම්වරයා විසින් මේ නියමාවලිය යටතේ වූ ස්වකීය යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා කොමිෂන් සභාවේ යම් නිලධරයකු වෙත සාමාන්‍ය හෝ විශේෂ බලය පැවරීමක් කරනු ලැබිය හැකි අතර, එම නිලධරයා විසින් ලේකම්වරයාගේ විධානය සහ පාලනයට යටත්ව එම බලය, කාර්යය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටුකිරීම සිදු කරනු ලැබිය යුතු ය.

5. ලේකම්වරයා විසින් -

(අ) පනත යටතේ දායක මුදල් වශයෙන් ගෙවනු ලබන සියලු මුදල් ද, අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලබන ආදායම ද ලබාගත යුතු අතර ඔහු විසින්, එම මුදල් සහ ආදායම් අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය ;

(ආ) අරමුදලේ මුදල්වල භාරකරු විය යුතු ය ;

(ඇ) පනතේ 94 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පනත යටතේ හෝ මේ නියමාවලිය යටතේ හිමිකම් ලබන තැනැත්තන් වෙත ගෙවීම් කරනු ලැබිය යුතු ය ;

(ඈ) වහා අවශ්‍ය නොවන අරමුදලේ මුදල්, අදාළ ආයෝජන කමිටුව විසින් යෝග්‍ය බවට තීරණය කරනු ලබන ආකාරයට යම් සුරැකුම්පත්වල ආයෝජනය කරනු ලැබිය හැකි ය ;

(ඉ) පනතේ 92 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව අරමුදලේ පොදු ගිණුම සහ එක් එක් දායකයා සඳහා වෙනම ගිණුම් පවත්වාගෙන යා යුතු ය ;

(ඊ) එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී අරමුදලේ ගිණුම් පොත් තුලනය කිරීමට කටයුතු සැලැස්විය යුතු ය ;

(උ) එක් එක් මුදල් වර්ෂයට අදාල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයක් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සකස් කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

6. (1) අරමුදලේ ආයෝජන කමිටු දෙකක් තිබිය යුතු ය. එනම් -

(අ) මහා පරිමාණ ආයෝජන වශයෙන් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ආයෝජන පිළිබඳ කටයුතු කිරීම සඳහා වූ මහා පරිමාණ ආයෝජන කමිටුව ; සහ

(ආ) සුළු ආයෝජන වශයෙන් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ආයෝජන පිළිබඳ කටයුතු කිරීම සඳහා සුළු පරිමාණ ආයෝජන කමිටුව.

(2) මහා පරිමාණ ආයෝජන කමිටුව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) කොමිෂන් සභාවේ සභාපතිවරයා ;

(ආ) ලේකම්වරයා ;

(ඇ) කොමිෂන් සභාවේ මූල්‍ය අංශයේ ප්‍රධානියා ; සහ

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවෙන් නියෝජිතයකු.

(3) සුළු පරිමාණ ආයෝජන කමිටුව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :-

(*අ*) කොමිෂන් සභාවේ සභාපතිවරයා ;

(*ආ*) ලේකම්වරයා ; සහ

(*ඇ*) කොමිෂන් සභාවේ මුදල් අංශයේ ප්‍රධානියා.

7. මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන රීති, නියෝග සහ චක්‍රලේඛවලට යටත්ව සකස් කරන ලද අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තිය මත පදනම්ව කොමිෂන් සභාව විසින් කලින් කල මහා පරිමාණ ආයෝජනවල සහ සුළු පරිමාණ ආයෝජනවල මූල්‍ය සීමාවන්, නිශ්චය කරනු ලැබිය යුතු ය.

8. ආයෝජන කමිටුවල සාමාජිකයන්ට කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ආකාරයට යම් කමිටු රැස්වීම් සඳහා සහභාගිවීම වෙනුවෙන් යම් දීමනාවක් ගෙවනු ලැබිය යුතු ය. දීමනා සහ වෙනත් වියදම් ලෙස ආයෝජන කමිටුවලට ගෙවනු ලබන මුදල් අරමුදලේ මුදල් වලින් ගෙවනු ලැබිය යුතු ය.

9. (1) අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තියට අනුකූලව, ආයෝජන යෝජනා ඇගයීම සඳහා ද, යෝග්‍ය ආයෝජන තීරණය කිරීම හෝ යෝග්‍ය ආයෝජන සිදුකිරීම සඳහා ද, ආයෝජන කමිටු නිතර රැස්විය යුතු ය.

(2) මහා පරිමාණ ආයෝජන කමිටුව විසින් ගනු ලබන තීරණ සෑම මාස හයකට වරක් ම අධීක්ෂණ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

### *අධීක්ෂණ මණ්ඩලය*

10. (1) අරමුදලේ කටයුතු යම් නිශ්චිත කාලපරාසයකට වරක් සමාලෝචනය කිරීම සඳහා ද, අරමුදලේ ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ කොමිෂන් සභාව වෙත උපදෙස් ලබාදීම සඳහා ද, කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලේ අධීක්ෂණ මණ්ඩලයක් තිබිය යුතු ය.

(2) එම මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :-

(*අ*) නිල බලයෙන් පත්වන සාමාජිකයන් තිදෙනෙකු, එනම් -

(i) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු කොමිෂන් සභාවේ සභාපතිවරයා ;

(ii) ලේකම්වරයා ;

(iii) මණ්ඩලයේ ලේකම්වරයා විය යුතු කොමිෂන් සභාවේ මුදල් අංශයේ ප්‍රධානියා ; සහ

(*ආ*) කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන පහත දැක්වෙන නම් කළ සාමාජිකයන් සිව්දෙනෙකු, එනම් -

(i) කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයකු ;

(ii) විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන් විමසා ලේකම්වරයා විසින් නම් කරනු ලබන තැනැත්තන් තිදෙනෙකු අතරින් කොමිෂන් සභාව විසින් තෝරාගනු ලබන ආර්ථික විද්‍යාව, කළමනාකරණය හෝ මුදල් පරිපාලනය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයක පුළුල් අවබෝධයක් ඇති අරමුදලේ දායකයකු ;

(iii) කම්කරු කොමසාරිස්වරයා විසින් නම් කරනු ලබන කම්කරු දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු ;

(iv) මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයකු.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය, මණ්ඩලයේ සභාපතිවරයා, නිල බලයෙන් පත් වූ සාමාජිකයකු සහ නම් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු ඇතුළුව සාමාජිකයන් පස් දෙනෙකු විය යුතු ය.

(4) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සියලු ප්‍රශ්න බහුතර සාමාජික ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු අතර මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කිරීමට නියමිත යම් කරුණක් පිළිබඳ ලැබෙන ඡන්ද ප්‍රමාණ සමාන වන අවස්ථාවකදී, සභාපතිවරයාට ස්වකීය ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) යම් නම් කළ සාමාජිකයකු කලින් ධුරය හිස්කරනු ලබයි නම් මිස, තමා පත්කළ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර ඔහු සේවයෙන් නෙරපනු ලැබුවහොත් මිස නැවත නම් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(6) යම් නම් කළ සාමාජිකයකු විසින් ඔහුව නම් කළ බලධරයා අමතනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉවත්වීමෙන් හෝ ඔහුව නම් කළ බලධරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් ධුරය හිස් කළ හැකි ය.

(7) නම් කළ සාමාජිකයකු මිය යැම, අශක්නුතාවයට පත්වීම හෝ ධුරය හිස්කරනු ලබන අවස්ථාවකදී (2)(ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන එම සාමාජිකයා වෙනුවෙන් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(8) මණ්ඩලය යටත් පිරිසෙයින් සෑම මාස තුනකට වරක්වත් රැස්විය යුතු ය.

(9) මණ්ඩලයේ යම් රැස්වීමක කටයුතු විධිමත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(10) කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් අවශ්‍ය බවට සලකන ඕනෑම අවස්ථාවකදී, මණ්ඩලයේ සාමාජිකයන් වෙත එක් සතියක දැන්වීමක් ලබාදීම මගින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය හැකි ය.

(11) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා සහභාගිවීම වෙනුවෙන් මණ්ඩලයේ සාමාජිකයන් වෙත කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් දීමනාවක් ගෙවනු ලැබිය යුතු ය. එම දීමනාවල සහ මණ්ඩලයේ වෙනත් පුනරාවර්තන වියදම් අරමුදලෙන් දැරිය යුතු ය.

(12) මණ්ඩලය පහත දැක්වෙන කර්තව්‍ය ඉටු කළ යුතු ය -

(අ) අරමුදලේ කටයුතු යම් නිශ්චිත කාලපරාසයකට වරක් සමාලෝචනය කිරීම ;

(ආ) අවශ්‍ය ප්‍රාග්ධන සංචිත පවත්වාගෙන යන අතරතුර ආයෝජනවලින් ඉහළ ප්‍රතිලාභ අත්කර ගැනීම පිණිස අරමුදලට අදාළ ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ උපදෙස් ලබා දීම ;

(ඇ) කොමිෂන් සභාව විසින් කලින් කල නිකුත් කරනු ලබන විධිවිධානවලට අනුකූලව ක්‍රියාකිරීම ;

(ඈ) වෙනත් ලිඛිත නීතිවලට යටත්ව දායකයන්ගේ වෙනම ගිණුම්වල බැරට පවතින මුදල් මත ගෙවනු ලැබිය යුතු පොළී අනුපාතිකය පිළිබඳ කොමිෂන් සභාව වෙත උපදෙස් ලබා දීම ;

(ඉ) අරමුදලේ ආයෝජන ලිපිගොනු සමාලෝචනය කිරීම සහ දායකයන්ට උපරිම ප්‍රතිලාභ ලබා දීම සහතික කිරීම සඳහා ආයෝජන ප්‍රතිපත්තිය පිළිබඳ ආයෝජන කමිටුවලට උපදෙස් ලබා දීම ;

(ඊ) අරමුදලේ දායකයන් වෙත ප්‍රදානය කිරීමට යෝග්‍ය බවට සලකනු ලබන වෙනත් ප්‍රතිලාභ යෝජනා කිරීම ;

(උ) එක් එක් වර්ෂය සඳහා වූ අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශය සමාලෝචනය කිරීම සහ ඉක්බිතිව ම එළඹෙන මුදල් වර්ෂයේ පළමු මාස තුනක කාලය ඇතුළත ඒ පිළිබඳ උපදේශන වාර්තාවක් නිකුත් කිරීම.

## IV වන කොටස

### *අරමුදලේ ප්‍රතිලාභ*

11. (1) පනතේ 93 වන වගන්තියේ සඳහන් කර ඇති ආකාරයට අරමුදලින් කරනු ලබන ගෙවීම්වලට අතිරේකව, යම් ප්‍රතිලාභ අරමුදල මගින් දායකයින් වෙත ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් කොමිෂන් සභාව විමසා කලින් කල එම ප්‍රතිලාභ නිශ්චය කරනු ලැබිය යුතු ය.

(3) අරමුදලේ ප්‍රතිලාභයක් වශයෙන් යම් දායකයකු වෙත අරමුදලින් ගෙවනු ලැබූ යම් මුදලක් ආපසු ගෙවීම පැහැර හැර ඇති විටක, පනතේ විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට අය කර ගනු ලැබිය යුතු ය.

## V වන කොටස

### *නම් කිරීම*

12. අරමුදලේ යම් දායකයකුගේ වෙනම ගිණුමක බැරට පවතින මුදල් ගෙවීම සඳහා පනතේ 93(2අ) වගන්තිය ප්‍රකාරව එම දායකයා විසින් කරනු ලබන නම් කිරීමක්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව විය යුතු ය.

13. නම් කිරීමක් සිදු කිරීමට අපේක්ෂා කරන යම් දායකයකු විසින් -

(අ) ඔහු විවාහක තැනැත්තකු නම්, ඔහුගේ කලත්‍රයා හෝ දරුවන් එක්ව හෝ වෙන් වෙන්ව නම් කරනු ලැබිය යුතු ය ;

(ආ) ඔහු අවිවාහක තැනැත්තකු නම්, වෙනත් යම් තැනැත්තකු නම් කරනු ලැබිය යුතු ය.

14. කිසිදු නම් කිරීමක් සිදු කිරීමට අපේක්ෂා නොකරන යම් දායකයකු, නම් කිරීමක් නොමැති බවට නම් කිරීමේ ලැයිස්තුවේ නිශ්චිතව සඳහන් කරමින් ස්වකීය අදහස ප්‍රකාශ කළ යුතු ය.

15. නම් කිරීමක් සිදු කරනු ලබන දායකයා මිය යාමට පෙරාතුව අවස්ථාවෝචිත පරිදි, එම නම් කිරීම සකස් කර කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත හෝ අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියා වෙත භාරදී ඇත්නම් මිස එවැනි නම් කිරීමක් වලංගු හෝ නීතියෙන් බලාත්මක නොවන්නේ ය.

16. සෑම නම් කිරීමේ ආකෘති පත්‍රයක් ම, කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ දායකයා සේවයේ නියුක්තව සිටින අංශයේ හෝ ශාඛාවේ ප්‍රධානියා ඉදිරිපිට දී සහ එම දායකයාගේ අත්සනට සාක්ෂි දරනු ලබන තවත් දායකයකු ඉදිරිපිට දී අත්සන් කරනු ලැබිය යුතු ය.

17. යම් තැනැත්තකුට අත්සන් කිරීමට නොහැකිවන අවස්ථාවක දී, ඔහුගේ අත්සන වෙනුවට කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ දායකයා සේවයේ නියුක්තව සිටින අංශයේ හෝ ශාඛාවේ ප්‍රධානියා ඉදිරිපිට දී ස්වකීය වම් මහපට ඇඟිලි සලකුණ තැබිය යුතු අතර එම මහපට ඇඟිලි සලකුණ එම නම් කිරීම සිදු කරනු ලබන තැනැත්තාගේ මහපට ඇඟිලි සලකුණ බවට තවත් දායකයකු විසින් එම නම් කිරීමේ පත්‍රයේ සහතික කරනු ලැබිය යුතු ය.

18. කිසිදු දායකයකුගේ නම් කළ තැනැත්තකු, දායකයකුගේ අත්සන හෝ මහපට ඇඟිලි සලකුණ සඳහා සාක්ෂි දැරීම හෝ සහතික කිරීම සඳහා සුදුස්සකු නොවිය යුතු ය.

19. එක් තැනැත්තකුට වැඩි තැනැත්තන් ගණනක් නම් කර ඇති අවස්ථාවක දී, මේ නියමාවලිය යටතේ වූ ප්‍රතිලාභ නම් කළ තැනැත්තන් අතර බෙදනු ලැබිය යුතු අනුපාතය නම් කිරීම කරනු ලබන දායකයා විසින් නම් කිරීමේ ආකෘති පත්‍රයේ නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

20. යම් දායකයකු විසින් සිදු කරන ලද යම් නම් කිරීමක එක් නම් කළ තැනැත්තකුට වඩා නම් කර ඇති සහ නම් කළ තැනැත්තන් සඳහා ගෙවිය යුතු කොටස් පිළිබඳ කිසිදු විධානයක් ලබා දී නොමැති අවස්ථාවක දී, මේ ආඥාපනත යටතේ ගෙවනු ලබන ප්‍රතිලාභ සමාන කොටස්වලින් එම නම් කළ තැනැත්තන් අතර බෙදනු ලැබිය යුතු ය.

21. (1) පහත සඳහන් අවස්ථාවල දී නම් කිරීමක් ප්‍රත්‍යාදිෂ්ට වන ලෙස සලකනු ලැබිය යුතු ය ; එනම් :-

(අ) නම් කළ තැනැත්තා මිය යෑම ;

(ආ) නම් කළ තැනැත්තන් එක් අයකුට වැඩි ප්‍රමාණයක් සිටින අවස්ථාවක දී, නම් කිරීම කරන ලද දායකයාගේ ජීවිත කාලය තුළ දී එම එක් නම් කළ තැනැත්තකු මියයන අවස්ථාවක දී ; හෝ

(ඇ) දායකයකු විවාහවීමට පෙරාතුව දායකයා විසින් නම් කිරීමක් සිදුකර, ඉන්පසුව එම දායකයා විවාහ වන අවස්ථාවක දී.

(2) යම් දායකයකු විසින් සිදු කරන ලද නම් කිරීමක් ප්‍රත්‍යාදිෂ්ට වන ලෙස සලකනු ලබන අවස්ථාවක දී, එම දායකයා විසින් අලුත් නම් කිරීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

22. (1) අරමුදලේ දායකයකුගේ නම් කළ තැනැත්තකු -

(අ) එම දායකයා විසින් අරමුදලට දායක මුදල් ගෙවනු ලබන කාලසීමාව තුළදී එම නම් කිරීම සිදු කර ඇත්නම් පමණක් ; සහ

(ආ) එම දායකයාගේ මරණයෙන් පසුව පමණක් ;

අරමුදලින් ගෙවීම් ලබාගැනීම සඳහා හිමිකම් ලබන්නේ ය.

(2) දායකයකු මිය යන අවස්ථාවේ දී යම් නම් කළ තැනැත්තකු බාලවයස්කරුවකු වන විටක, එම නම් කළ තැනැත්තාට අරමුදලින් ගෙවිය යුතු ගෙවීම් -

(අ) එම මිය ගිය දායකයාගේ බූදලය සම්බන්ධයෙන් බූදල් නඩුවක් නොපවතී නම්, එම නම් කළ තැනැත්තාගේ නමට රජය අනුමත බැංකුවක පනතේ විධිවිධානවලට යටත්ව එම මුදල් තැන්පත් කරනු ලැබිය යුතු ය ; හෝ

(ආ) මිය ගිය දායකයාගේ බූදලය සම්බන්ධයෙන් බූදල් නඩුවක් විභාග වෙමින් පවතින අවස්ථාවක දී, අධිකරණය විසින් ආඥා කරනු ලබන ආකාරයට එම මුදල් තැන්පත් කරනු ලැබිය යුතු ය.

23. දායකයාගේ මරණය සිදුවන අවස්ථාවේ දී, වලංගු නම් කිරීමක් බලාත්මකව නොපවතී නම් නැතහොත් අවස්ථාවෝචිත පරිදි නම් කළ තැනැත්තා හෝ නම් කළ තැනැත්තන් මියගොස් ඇති අවස්ථාවකදී, අදාළ ගෙවීම් එම මිය ගිය දායකයාගේ නෛතික උරුමක්කරුවන් වෙත ගෙවනු ලැබිය යුතු ය.

## VI වන කොටස

### *ගිණුම් සහ විගණනය*

24. (1) අරමුදලේ මුදල් වර්ෂය රජයේ මුදල් වර්ෂයම වන්නේ ය.

(2) එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් වූ අරමුදලේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු අතර විගණනය සඳහා වූ පිරිවැය අරමුදලින් ඔහු වෙත ගෙවනු ලැබිය යුතුය. මේ ඡේදය යටතේ විගණකාධිපතිවරයා වෙත කරනු ලබන සියලු ගෙවීම් ඒකාබද්ධ අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය.

(3) විගණකාධිපතිවරයාට හෝ අරමුදලේ ගිණුම් විගණනය කිරීම සඳහා ඔහු විසින් බලය පවරා ඇති ඔහුගේ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට ගිණුම් විගණනය කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය බවට සලකනු ලබන සියලු පොත් සහ ලේඛන වෙත ප්‍රවේශ වීමට හැකි විය යුතු අතර එම කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වූ ද, ඔවුන්ගේ දැනුමට ගෝචර වන සහ ඔවුන් විසින් තහවුරු කරනු ලැබිය හැකි වූ තොරතුරු ද සමග ඒ පොත් සහ ලේඛන මණ්ඩලය විසින් හෝ ලේකම්වරයා විසින් සපයා දිය යුතු ය.

(4) අරමුදලේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් පරීක්ෂාකර -

(අ) තමාට අවශ්‍ය සියලු තොරතුරු තමා වෙත ලැබී ඇති හෝ ලැබී නොමැති බවට ප්‍රකාශ කරමින් ;

(ආ) වාර්තාවේ සඳහන් ගිණුම්, අරමුදලේ කටයුතු සත්‍ය ලෙස සහ සාධාරණ ලෙස එළිදැක්වෙන පරිදි නිවැරදිව සකස් කර ඇති බවට ප්‍රකාශ කරමින් ; සහ

(ඇ) තමාගේ මතය අනුව, එම ගිණුම්වල යම් පරීක්ෂා කිරීමක දී, එම ගිණුම්වල යම් අයිතමයක් පිළිබඳ අවධානය යොමු කිරීමට පාර්ලිමේන්තුව උනන්දු විය හැකි බවට අවධානය යොමු කරමින්,

වාර්ෂික වාර්තාවක් කොමිෂන් සභාව වෙත භාර දිය යුතු ය.

## VII වන කොටස

*අභියාචන*

25. මේ ආඥාපනත යටතේ -

(අ) ලේකම්වරයා විසින් ගනු ලබන යම් තීරණයකින් ; හෝ

(ආ) උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධානියකුගේ හෝ කොමිෂන් සභාවේ යම් ක්‍රියාවකින් හෝ පැහැරහැරීමකින්,

අතෘප්තියට පත්වන යම් දායකයකු විසින් කම්කරු කොමසාරිස්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

## VIII වන කොටස

*අර්ථනිරූපණ*

26. මේ නියමාවලියේ -

"පනත" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ ;

"කොමිෂන් සභාව" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 2 වන වගන්තිය මගින් පිහිටවනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ ;

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නෙන්, මේ පනත යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ලෙස සැළකෙන විශ්වවිද්‍යාලයක්, මණ්ඩපයක්, විවෘත විශ්වවිද්‍යාලයක්, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් හෝ උසස් අධ්‍යාපන ආයතනයක් හෝ මධ්‍යස්ථානයක් අදහස් වේ ;

"අමාත්‍යවරයා" යන්නෙන්, උසස් අධ්‍යාපන විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ ;

"ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව" යන්නෙන්, මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2003 ජුනි මස නිකුත් කරනු ලැබූ රාජ්‍ය ව්‍යවසාය යහ පාලනය කිරීම සඳහා වූ මාර්ගෝපදේශ ප්‍රකාරව පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව අදහස් වේ.

04 - 32

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.